***<u>කොළඹ බලහත්කාර ඉවත් කිරීම්: අහස සිඹින විහරණය</u>*** යනු ශ්‍රී ලංකාවේ අග නගරයෙහි බලහත්කාර ඉවත් කිරීම් පිළිබඳව ඉදිරිපත් කෙරෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි දෙවන වාර්තාවයි. මෙම වාර්තාව පරීක්ෂාවට ලක් කරනුයේ මූලික වශයෙන් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය (URP) මගින් 2020 වන විට මුඩුක්කුවලින් තොර කොළඹ නගරයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් එහි අලංකරණ න්‍යාය පත්‍රයෙහි කොටසක් ලෙස කලින් රජයේ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සිදු කෙරුණු ඉවත් කිරීම් ය.

කොළඹ අඩු ආදායම් ලාභී නිවැසියන් ඉවත් කිරීම් ආරම්භ කරන ලද්දේ යුද්ධය අවසාන වීමට බොහෝ කලකට පෙර හා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය (URP) ආරම්භ කිරීමට දිගු කලකට පෙර ය. එය ජවය හා අධිකාරය ලබා ගන්නා ලද්දේ නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශය හා ශ්‍රී ලංකාවේ සංවර්ධනයෙහි හා අලංකරණයෙහි ප්‍රධාන නිර්මාණ ශිල්පියා බවට පත් වූ එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ යටතට ගෙන ඒමෙන් පසුව ය. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතට වැටෙන ප්‍රජාවන් දෙමටගොඩ නැවත පදිංචි කරවීමේ කඩිමුඩිය ක්‍රියාවට නංවන ලද්දේ ප්‍රධාන වශයෙන් ජනතාවගේ ජීවිත නගාලීමේ අපේක්ෂාවෙන් නොව ඉහළ වාණිජ වටිනාකමින් යුත් දේපළ නිදහස් කර ගැනීමේ අපේක්ෂාවෙනි. මෙම ව්‍යාපෘතිය මගින් වඩාත් ප්‍රශ්නකාරී බවට පත් කරන ලද්ද වූයේ භූමිය අත්පත් කර ගැනීමට උපයෝගී කර ගන්නා ලද මාධ්‍යයන් ය. ජනතාව ඔවුන්ගේ නිවෙස්වලින් ඉවත් කිරීමට මිලිටරි බලය, බිය ගැන්වීම හා හිරිහැරයට පත් කිරීම උපයෝගී කර ගන්නා ලද අතර ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දී ඉඩම් අත්පත් කර ගැනීම හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීති අනුගමනය නොකෙරුණි.

ප්‍රජාවන් අද ඔවුන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙන දෙමටගොඩ හා වනාතමුල්ලෙහි අහස උසට නගින ගොඩනැගිලිවල අලුතෙන් පදිංචි කරවනු ලැබිණ. ජනතාවට බද්ධ නිවාස දෙන ලද්දේ අය කිරීමෙන් තොරවය යන ජනප්‍රිය විශ්වාසයට වෙනස්ව ඉවත් කරනු ලැබූවන් පළමුවන මාස තුන ඇතුළත රුපියල් ලක්ෂයකට වැඩි මුදලක් ද ඇතුළුව ඉදිරි අවුරුදු 20 පුරා රුපියල් දශ ලක්ෂයකට වඩා වැඩි මුදලක් ගෙවිය යුතුව තිබේ. මේ ඔවුන්ගේ කලින් වාසස්ථානවලට ඔප්පු තිබෙනවා ද නැද්ද යන්න නොසලකා ය. ඔවුන්ට තවමත් ඔවුන්ගේ බද්ධ නිවාසවලට ඔප්පු ලබා දීමට තිබෙන අතර බද්ධ නිවාස විකිණීම, කුලියට දීම හා උගසට තැබීම පිළිබඳ සීමාවන් ද පනවා තිබේ. මෙහි තේරුම මූල්‍ය සුරක්ෂිතතාවේ මූලාශ්‍රයක් ඔවුන්ගෙන් පැහැර ගෙන තිබෙනවා යන්න ය. නාගරික සංවර්ධන අධිකාරියට (UDA) අනුව එක් බද්ධ නිවාසයක වටිනාකම රු. 70 ලක්ෂයකි. නාගරික සංවර්ධන අධිකාරිය විසින්ම ඉදිරිපත් කරනු ලැබ තිබෙන ගණන් හිලව්වලට අනුව නොකියා කියන පිරිවැය සැබවින්ම විස්මය දනවන අන්දමින් අඩු හෙයින් මෙම පිරිවැය ඇස්තමේන්තුව බෙහෙවින් සැකයට තුඩු දෙන සුළු ය.

ඉඩකඩ පිළිබඳ අඩුව බොහොමයක් ජනයා මුහුණ දෙන බරපතල ප්‍රශ්නයකි. සෑම බද්ධ නිවාසයක්ම වර්ග අඩි 400 ක් පමණ වන අතර අලුතෙන් පදිංචි කරවන ලද බොහෝ දෙනාට එමෙන් දෙගුණයක් විශාල හා එක් පවුලකට වඩා වැඩි ඉඩකඩ සහිත නිවාස තිබිණ. 'එක නිවසකට එක බද්ධ නිවසක්' යන ප්‍රතිපත්තියේ තේරුම අද සමහර බද්ධ නිවාසවල 14 දෙනෙකු දක්වා සිටිනවාය යන්න හා හුදෙක් ඉඩකඩ අඩු හෙයින්ම ඇතැම් පවුල්වලට කොහේ හරි කුලියට ජීවත්වීමට බල කෙරී තිබෙනවා ය යන්න ය. මෙම ප්‍රශ්නය ඔවුන්ගේ නිවාස පාදක කර ගෙන ආදායම් ඉපයීමේ කටයුතුවල යෙදී සිටියවුන් ද විපතට හෙළා තිබේ. ජීවිකා වෘත්තියේ සිට ළමුන්ගේ පාසල් යාම, ගොඩනැගිලිවල බාල නඩත්තුව හා ඉදිකිරීම්වල ගුණාත්මකභාවය දක්වා තවත් බරපතල ප්‍රශ්න ගණනාවක් ද නොනිමව පවතී.

අහස උසට නැගි බද්ධ නිවාසවල වෙසෙන්නවුන් විසින් මුහුණ දෙනු ලබන ප්‍රශ්නවලට අමතරව මෙම වාර්තාවෙහි අවධාරණය කර දක්වනු ලබන තවත් බොහෝ සැලකිල්ලට ගත යුතු කාරණා තිබේ.

ප්‍රජාවන් සමග පැවති අදහස් හුවමාරු කර ගැනීම්වල දී ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රයේ අවධානයට ලක් කරන ලද බරපතල ප්‍රශ්නයක් වන්නේ 2010 මැයිවල ඔවුන්ගේ නිවෙස්වලින් බලහත්කාරී ලෙස ඉවත් කරන ලද කොම්පඤ්ඤ වීදියේ මිව්ස් වීදියෙහි  හිටපු නිවැසියන්ගේ සිද්ධිය වැනි ඒවායෙහි ජනයාට ඡන්ද බලය අහිමි වීමයි. තවමත් මෙම නිවැසියන්ට ස්ථිර නිවාස සැපයීමට තිබෙන අතර ඔවුන් තවමත් ජීවත් වන්නේ කුලියට හෙයින් අළුත් ස්ථානයක ලියා පදිංචි වීමට හැකි වී නැත. ප්‍රතිඵලය වී ඇත්තේ ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඔවුන්ගේ මූලික අයිතිය උල්ලංඝනය වීම ය. එසේම වැල්ලවත්තේ මයුර පෙදෙසේ ද එවන් ප්‍රශ්නයක් ඇත. මයුර පෙදෙසේ බද්ධ නිවාස සංකීර්ණයක් විවෘත කිරීමෙන් මාස 7 කට අධික කාලයකට පසුත් තවමත් පවුල් 17 කට පොරොන්දු වූ පරිදි නිවාස ලබා ගැනීමට තිබේ.

ප්‍රජාවන් නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන නව අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුව වෙත මෙම ප්‍රශ්න සවිස්තරාත්මක ලෙස ලිඛිතව ඉදිරිපත් කර තිබේ. 2015 මාර්තුවල පත් කරන ලද මෙම කමිටුවෙන් අදහස් කළේ කලින් රෙජිමය යටතේ කරන ලද කටයුතු පරීක්ෂා කිරීම ද ''මෙම නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ සිදු කර තිබෙන අසාධාරණයන් විමර්ශනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම හා පීඩාවට පාත්‍ර ජනතාවට වන්දි ගෙවීම ද කඩිනම් කිරීම ය.''

නව ආණ්ඩුව හා නව නාගරික සංවර්ධන අමාත්‍යවරයා හමුවේ ඇති කාර්ය භාරය සැබවින්ම අභියෝගාත්මක එකක් වන අතර එය කඩිනම්ව ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය එකකි. සම්පූර්ණ විමර්ශනයක් කරනු ලබන තෙක් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ වන සියලු ව්‍යාපෘති හා කටයුතු නතර කරනු ලැබීම හා මේ දක්වා අත්දැකීම් ඇගැයීමට ලක් කිරීම අවශ්‍ය වේ. අවාසනාවකට අපට තවමත් මෙය කරනවා ද යන්න දෙස බලා සිටීමට සිදුව තිබෙන  අතර ඒ වෙනුවට දක්නට ලැබෙන්නේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ කටයුතු දිගටම කර ගෙන යාමක් පමණි.

කොළඹ සංවර්ධන මෙහෙයුමෙහි ලෝක බැංකුවේ භූමිකාව ද මෙම වාර්තාවේ ඉස්මතු කරනු ලැබ තිබේ. අපේ කලින් වාර්තාවෙහි නාගරික සංවර්ධන අධිකාරිය විසින් කර ගෙන යමින් තිබූ ඉවත් කිරීම් පිළිබඳව කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉතා සමීපව වැඩ කරමින් සිටි ලෝක බැංකුවේ නිහඬතාව අපි සටහන් කළෙමු.  කොළඹ නිවැසියන් දහස් ගණනකට අහිමි කරන ලද සියලු ආරක්ෂණයන් ලෝක බැංකු මූල්‍ය ආධාර ලබන ව්‍යාපෘතිය යටතට අයත්වන පවුල්වලට දෙනු ඇතැයි උපකල්පනය කෙරිණ. කෙසේ වුව ද බැංකු ව්‍යාපෘතිය යටතේ අලුතෙන් පදිංචි කරවන ලද පවුල් පවා හමුදාව විසින් හිරිහැරයට හා තර්ජනයට පාත්‍ර කරන ලද අතර ඔවුන්ගේ නිවෙස්වලින් බලහත්කාරයෙන් ඉවත් කරනු ලැබිණ.  ඉකුත් රෙජිමය යටතේ  ලෝක බැංකුව නාගරික සංවර්ධන අධිකාරිය වැනි හමුදා පාලිත ආයතනයකට ආධාර සැපයීම හා එහි ධාරිතාව ගොඩනැගීම මගින් මිලිටරිකරණයට ආධාර කළේ ය. බැංකුව අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවලට අනිච්ඡානුග නැවත පදිංචි කිරීම් කොතරම් හොඳට හැසිරවිය හැකි ද යි එය කියන කතා තිබියදීම බැංකුව ඔවුන්ගේ ව්‍යාපෘති මගින් පීඩාවටපත්  ජනතාව ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියා කිරීමට අසමත්ව ඇත.

මෙම වාර්තාව සමාප්ත හෝ සම්පූර්ණ එකක් නොවේ. එහෙත් නාගරික සංවර්ධන අධිකාරියේ පුනර්ජීවන න්‍යාය පත්‍රයේ එන මිථ්‍යාව හා යථාර්ථය පිළිබඳ දළ විග්‍රහයක් දීම අරමුණු කරයි. මෙහි දී ක්ෂණික සහනයක් සඳහාවන අවශ්‍යතාවක් තිබෙන්නා සේම භූමියේ වාණිජ වටිනාකම නොව ජනතාව ගැන සිතේ තබා ගෙන සකස් කරනු ලබන දිගු කාලන විසඳුම් හා ප්‍රතිපත්ති ගවේෂණයේ ද අවශ්‍යතාවක් තිබේ.  මෙම වාර්තාවේ ඉදිරිපත් කර තිබෙන නිර්දේශ කොළඹ නගරය සියල්ලන්ටම ජීවත්වීමට සුදුසු පුරවරයක් කරනු පිණිස සැලකිල්ලට ගත යුතු හා මුල පිරිය යුතු දිගු කාලීන පියවරවලට අමතරව ආණ්ඩුව විසින් ගනු ලැබීම අවශ්‍ය කරන හදිසි පියවර කිහිපයක් ඉස්මතුකර දක්වයි.

Full report - http://www.cpalanka.org/forced-evictions-in-colombo-high-rise-living/